**ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශනය

### 1.1 තත්ත්වාගණනය කල මතය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2008 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/218 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කල අගයට ගිණුම්ගත කල යුතු වුවත්, රු.මිලියන 13 ක වියදමින් පොලොන්නරු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සහ රු.මිලියන 15.15 ක වියදමින් ප්‍රධාන කාර්යාල නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් 2017 හා 2018 වර්ෂවල නිමකර තිබුණද මෙම වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් නිමකර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | පොළොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය සිදු කළ අතර ඊට අදාළ රු.මිලියන 13 ක ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී. අංක 150 නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සම්පූර්ණ ගෙවීම් 2014 වර්ෂය තුළදී සිදු කර ඇත. |
| (ආ)2017 වර්ෂයේදී ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ඉඩම් බැංකු ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 37.83 ක පිරිවැයකින් ලබා දී තිබුණු ලැප්ටොප් පරිගණක, ඔප්ටිකල් කේබල් සවි කිරීම හා පිඹුරු පරිලෝකනය යන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව වෙනත් ආයතනවලින් ලබාදුන් ප්‍රතිපාදන මත මිලදී ගෙන ඇති වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | මෙම වත්කම් අප ආයතනයේ තොග වාර්තාවන්ට නිසි පරිදි ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් සිගාස් වැඩසටහන මගින් මෙම වත්කම් පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ)මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂය අවසානයට වූ රු.255,080,143 ක ශේෂය ගැලපීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල නොකර එම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස අනාවරණය කර තිබුණි. | චක්‍රලේඛයේ 7 ඡේදය යටතේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා දක්වා ඇති මඟ පෙන්වීම් අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය හඳුනාගැනීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු වීම | 2018 දෙසැම්බර් 31 දිනට රු.255,080,143 අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ සටහන් කරන ලදි. ගිණුම තුලනය කිරීමේදී මූල්‍ය වත්කම් යටතේද එම මුදල සටහන් කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන ආකෘතිවලට අනුව මෙම වර්ෂයේ ප්‍රථමයෙන් අවසාන ගිණුම් සකස් කිරීම සිදුකරන ලද බැවින්, ඉදිරියේදී මෙවැනි වරදක් සිදු නොවීමට සටහන් කර ගන්නා ලදී. |

| | | |
|---|---|---|
| (ඇ)සමාලෝචිත වර්ෂයේ වාහන දෙකකට සිදු වූ අනතුරු දෙකකින් වූ රු.66,819 ක අලාභහානි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වත්කම්වලට සිදු වූ අලාභහානි මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කල යුතු වීම. | එක් වාහනයක ප්‍රාරම්භක වාර්තා ලැබීම ප්‍රමාද වීම නිසා අනාවරණය කිරීමට නොහැකි වූ අතර, අංක 250 - 0424 දරන වාහන අනතුරේ අලාභයෙන් කොටසක් අයකර ගනිමින් පවතී. |
| (ඉ)දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට රු.මිලියන 14.26 ක ගිවිසුම්ගත මුදලක් මත නිදන ශාලාවක් ඉදිකර වැඩ අවසන් කර දෙපාර්තමේන්තුවට භාර දී තිබුණ ද එහි පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. | වැඩනිමකර ඇති ගොඩනැගිලිවල පිරිවැය ගිණුම් ගත කළ යුතු වීම. | කොන්ත්‍රාත්කරු විසින් අවසන් බිල්පත ලබා දී නොමැති නිසා ගොඩනැගිල්ලේ සම්පූර්ණ වැඩ වටිනාකම ලබා ගැනීමට නොහැකි වීමෙන් එය 2018 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් වී නොමැති බව සඳහන් කරමි. |
| (ඊ)දෙපාර්තමේන්තුවට අයිති හෙක්ටයාර් 1.3139 ක ඉඩම, බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි නිල නිවස, අනුරාධපුර පෙරසවි කඳවුර සහ දකුණු පලාතේ තවත් ගොඩනැගිලි 02 ක්ද තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කළ යුතු වීම. | ප්‍රාදේශීය වශයෙන් එක් එක් කාර්යාල වලින් ලබා දුන් ඉඩම් හා ගොඩනැගිලි වලට අදාළ දත්ත තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් පසු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තා ලබා දී ඇත. මේ වන තෙක් අනෙක් ඉඩම් හා ගොඩනැගිලි ඉදිරියේ දී තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2** <u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කල ඒසීඒ - 3 ආකෘති පත්‍රය පරිදි 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ රු.34,898,068 ක ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි. | වර්ෂ අවසානයේ අග්‍රිම ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කල යුතු වීම. | 2016 වර්ෂයේ සිගාස් වැඩසටහන යාවත්කාලීන කිරීමට පෙර මෙවැනි වෙනසක් අග්‍රිම ගිණුම්වල දැකිය හැකි නොවූ අතර 2016 න් පසු හදුන්වා දුන් නව සිගාස් වැඩසටහන (New Version) යටතේ ගිණුම් තැබීමට හදුන්වා දුන් නව ක්‍රමවේදයට අනුව පෙන්නුම් කරන ලද වෙනසකි. ඊට අනුකූලව මෙම පෙන්නුම් කරන |

| | | |
|---|---|---|
| | | ශේෂයෙන් කිසිදු බලපෑමක් ගිණුම්වලට ඇති නොවේ. |
| (ආ)රජයේ තක්සේරුකරුවන්ගේ වාර්තාවලට අනුව 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම්, ගොඩනැගිලි හා වාහනවල වටිනාකම් පිළිවෙලින් රු.5,682,713,500 ක්, රු.1,020,873,500 ක් හා රු.561,905,000 ක් වුවත්, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.5,684,129,500 ක්, රු.1,008,987,793 ක් හා රු.601,745,000 ක් ලෙස අනාවරණය කර තිබුණි. | අදාල වත්කම්වල තක්සේරු අගයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කල යුතු වීම. | 2018 වර්ෂයේදී සිගාස් වැඩසටහන තුළ බොහෝ මූල්‍ය නොවන වත්කම් ද්විගණනය තිබීම හේතුවෙන් භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි එම අගයන් ශුන්‍ය කර නැවත එම තොරතුරු ඇතුලත් කරන ලදී. එම තොරතුරු ඇතුලත් කිරීමේදී සිදු වූ දෝෂයන් හේතුවෙන් මෙම වෙනස්කම් සිදු වී ඇත. වාහන වටිනාකම් ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් රක්ෂණ ඇස්තමේන්තු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඇත. |
| (ඇ)ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් ඩබල් කැබ් රථයක් රු.මිලියන 1.3 කට තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වෙනත් ආයතනවලට අයිති වත්කම් අස්ථිත්වයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොකළ යුතු වීම. | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් මෙම වාහනයද ඇතුලත්ව තවත් කැබ් රථ 13 ක් අප දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති අතර අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ලේඛන සියල්ල භාර දී තිබුණද එහි ලියාපදිංචි සහතිකය අස්ථානගතවී ඇති බැවින් ලියාපදිංචි සහතිකය ලබාගත් පසුව වාහනය පවරාගත හැකිවනු ඇත. |
| (ඈ)සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 75.29 ක මුදලක් මිනින්දෝරු කාර්යාල ඇතුළුව ගොඩනැගිලි 07 ක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු අතර, මෙම ගොඩනැගිලි ඉදිකෙරෙමින් පැවතියද එම මුදල මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | 2018 වර්ෂයේ යෝජිතව තිබූ නව ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රු.මිලියන 162 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අප දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර තිබුණි. නමුත් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණයට සරිලන අක්මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට නොහැකි වීමෙන් 2018 දෙසැම්බර් 31 දිනට මෙම වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන සඳහා අක්මුදල් ලබා ගැනීමේ වාර්තාවන් 2019 වර්ෂය තුලදී ලබා දීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට අවසාන නොනිමි වැඩ ශේෂය සඳහා මෙම දත්ත ඇතුළත් වී නොමැත. |

### 1.6.3 රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 01 සිට 35 දක්වා කාල පරාසයක් තුල විශ්‍රාමගත්, මියගිය, සේවය හැරගිය සහ වැඩ තහනම් කල නිළධාරීන්ගෙන් අයකරගත යුතු රු.මිලියන 6.59 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | විශ්‍රාම ගත් හා මිය ගිය නිලධාරීන්ගෙන් මේ වන විට රු.601,250.64 ක මුදලක් අයකර ගෙන ඇති අතර ඉතිරි ශේෂයද අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.<br><br>රු.124,433ක ණය ශේෂයෙන් රු.68,457 ක ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිතයෙන් අය කර ගැනීමට තොරතුරු යවා ඇත. |

### 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.මිලියන 6,693 ක ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය තහවුරු කිරීමට අදාල ඔප්පු සහ අනුමත ගොඩනැගිලි සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාල ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | මෙම ලේඛන ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 880 | දෙපාර්තමේන්තුවේ මුදල් භාර නිළධාරින් 37 දෙනෙකු සඳහා ඇප තබා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඇප ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | දැනට මුදල් භාර කටයුතුවල නියුතු වන්නේ වෙනත් සේවාවලට අදාල නිළධාරින් බැවින් ඉදිරියේදී එම නිළධාරින්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ii) මුදල් රෙගුලාසි 891(1) | ඇප තැබිය යුතු නිළධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුවේ වාහන 59 ක් සඳහා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කල යුතුවීම. | 2018 වර්ෂයේ සියළුම පලාත් කාර්යාලවලින් දෛනික ධාවන සටහන් යවා ඇත. |
| (ආ)2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | නිළධාරියකුට ලබාදිය හැකි උපරිම ආපදා ණය සීමාව රු.250,000 ක් වුවද, නිළධාරින් තිදෙනෙකුට එකතුව රු.1,034,945 ක් වූ ආපදා ණය ලබා දී තිබුණි. | උපරිම ණය සීමාව ඉක්මවා ණය ලබා නොදිය යුතුවීම. | වැඩිපුර ගෙවන ලද ණය ශේෂ අය කර ගැනීමට අදාළ නිලධාරීන්ට දන්වා ලිපි යොමු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ..

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ආදායම් පුරෝකථනය හා ඇස්තමේන්තු කිරීමේදී 2002 ජුලි 17 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ අංක 01/2002 හි 5 ඡේදය ප්‍රකාරව අතීත ප්‍රවණතාවයන් හා ඒවායේ විශේෂ | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම | ව්‍යවස්ථාපිත මැනුම් සඳහා දෙපාර්තමේන්තුව මුදල් අයනොකරන අතර, සංස්ථා හා මණ්ඩල වැනි රාජ්‍ය ආයතනවල ඉල්ලීම් මත මැනුම් කරන විට මුදල් අයකරයි. මේ නිසා එක් එක් |

| | | |
|---|---|---|
| ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 350 ක ආදායමක් ඇස්තමේන්තුකර තිබුණද සත්‍ය ආදායම රු.මිලියන 433 ක් වූයෙන් සියයට 24 ක ඌන ආදායම් ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. | | වර්ෂයේ දී රජයේ සංවර්ධන ව්‍යාපෘතිවල ස්වභාවය අනුව ආදායම වෙනස් වන බැවින් නිශ්චිතව පුරෝකථනය කල නොහැකි තත්ත්වයක් පවතී. |
| (ආ) දෙපාර්තමේන්තුවෙන් සැපයෙන ඉඩම් තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් නොකිරීම හා බොහෝ සිතියම් යාවත්කාලීන නොවීමත්, අලෙවි ප්‍රවර්ධන ක්‍රියාමාර්ග නොගැනීමත් නිසා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සාමාන්‍ය සිතියම් විකිණීමේ ආදායම රු.මිලියන 2.75 කින්ද විශේෂ සිතියම් විකිණීමේ ආදායම රු.මිලියන 1.27 කින්ද 1:10,000 අංකිත දත්ත විකිණීමෙන් ලද ආදායම රු.මිලියන 8.51 කින් ද පහත බැස තිබුණි. එසේ වුවද ආදායම් ඉහල නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ආදායම් මාර්ග වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ සිතියම් අලෙවි ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය මඟින් වැඩසටහන් ඉදිරිපත් කිරීමට හෝ පුවත්පත් රූපවාහිනි දැන්වීම් පළ කිරීමට වෙනම ප්‍රතිපාදන කිසිවක් වෙන්කර නොමැත. නමුත් අපගේ දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සියලුම සිතියම් හා නව නිපැයුම් සියල්ල පළකර ඇති අතර ඒවායේ මිල ගණන් ද දක්වා ඇත. |

## 2.2 <u>වියදම් කළමනාකරණය</u>

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 12 කට අදාලව සියයට 7 ක සිට සියයට 73 ක් දක්වා පරාසයක් තුල රු.මිලියන 144.87 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 15 ට අදාලව සියයට 8 ක සිට සියයට 70 ක් දක්වා පරාසයක් තුල රු.මිලියන 35.57 ක් වශයෙන් එකතුව රු.මිලියන 180.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. | මූලධන වැය විෂයන් 12 කට අදාලව හා පුනරාවර්තන වැය විෂයන් 15 කට අදාලව සඳහන් කර ඇති පරාසයන් තුල ප්‍රතිපාදන ඉතිරිව ඇත. |

### 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල එළඹි රු.4,430,025 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරවු කර නොතිබුණි. | බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | නිශ්චිතව හඳුනාගන්නා ලද බැරකම් පමණක් සටහන් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා වීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ගුණාත්මක භූමි තොරතුරු සැපයීම ප්‍රධාන මෙහෙවර වේ. ඒ අනුව පසුගිය දශකයකට අධික කාලය තුල ශ්‍රී ලංකා භූමියෙහි සිදු වූ වෙනස්වීම් යාවත්කාලීන කල සිතියම් ප්‍රකාශයට පත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදුකල යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය 2008 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර ප්‍රකාශයට පත්කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ඉස්මතුවන ආකාරයට ප්‍රායෝගිකව කටයුතු කළ යුතු වීම. | ජාතික සිතියම් සංග්‍රහය සඳහා වැඩි ඉල්ලුමක් නොමැති වීම නිසා ඒවා යාවත්කාලීන කිරීමට ප්‍රමුඛතාවය ලබා දී නොමැත. 2016,17 වර්ෂවලදි 1:50,000 සිතියම්වල දෙවන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කලද ක්ෂේත්‍රයේ විමර්ශන කටයුතුවලදී ඇති වූ අපහසුතා මත එය යම් ප්‍රමාණයක අඩාල වුවද 2018 වර්ෂය අවසානයේදී මෙම සිතියම්වල සියයට 98 ක ප්‍රමාණයක් නිමකර ප්‍රකාශයට පත් කර ඇත. |

### 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 13 කින් 08 ක් පමණක් ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් කර තිබුණු අතර, එම එක් එක් ක්‍රියාකාරකම් යටතේ වූ සංරචක සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල සහ ආදායම එකතු කිරීම සම්බන්ධ ඉලක්කයන් හා ඊට අදාල | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉස්මතුවන ආකාරයට ක්‍රියාකාරි සැලැස්ම පිළයෙල කල යුතු අතර, වියදම් සහ ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් ඉලක්ක සහ කාල වකවානු ඇතුලත් කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

කාල වකවානු ඇතුළත් කර නොතිබුණි.

## 3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට 1:10,000 පරිමාණයේ සිතියම් 1834 ක් නිර්මාණය කල යුතු වුවද නිර්මාණය කර තිබුණේ සිතියම් 700 ක් පමණි. | අපේක්ෂිත ඉලක්කයක් කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2019 මැයි 31 දින වන විටත්, පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මාස 08 ක් සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීමේ ප්‍රසම්පාදනයේදී අඩුම මිල ඉදිරිපත් කල සාරානුකූල ප්‍රතිචාර දැක්වූ ලංසුකරුට නිර්ණායකයන් අනුව ලබාදිය යුතු ලකුණු ප්‍රමාණයට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා දීම නිසා වැඩි මිල ලංසුකරුවකු තෝරා ගැනීමට සිදු වීමෙන් රු.මිලියන 1.17 ක් වැඩිපුර ගෙවා යථෝක්ත සේවාව ලබා ගැනීමට සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු වලදී රජයට වඩා වාසිදායක වන අයුරින් කටයුතු කළ යුතු වීම. | මිල ගණන් අනුව අංක 08 ස්ථානයට අඩුමිල ඉදිරිපත් කල ලංසුකරු පුහුණු නිළධාරියකු යොදවා ගිණි අවි පුහුණුව ලබා දෙන බවට සඳහන් කර තිබීම නිසා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. |

**3.6** **<u>වත්කම් කළමනාකරණය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) නිශ්ක්‍රීය වත්කම්**<br>දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නිල නිවාස 21 ක්, ඌව පලාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ තාක්ෂණික නිළධාරි නිල නිවස හා මෝටර් වාහන 13 ක් වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා කාල පරාසයක් තුල නිශ්කාර්යව පැවතුණත්, එම වත්කම් අළුත්වැඩියාකර පරිහරණයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | වාහන 06 ක ගර්හිත කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, වාහන 06 ක් සඳහා නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. එක් වාහනයක වැසි අංකය පුපුරා ඇති බැවින් ගර්හිත කිරීමට ප්‍රශ්ණ පැන නැගී ඇත. |
| **(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.** | | |
| ඉඩම් අමාත්‍යාංශයේ බිම් සවිය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිලි පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පැවතුණි. | වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ලබාදුන් වත්කම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම වත්කම් ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

**3.7** **<u>පාඩු හා හානි</u>**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 01 සිට වර්ෂ 29 කට අධික කාල පරාසයක් තුල අවස්ථා 47 කදී වාහන හා අනෙකුත් වත්කම්වලට සිදුවී ඇති රු.මිලියන 6.5 ක අලාභහානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.103 පරිදි පාඩු හා හානි සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම. | මෙම අනතුරු 47 වාහන 32 කට සිදු වී ඇති අතර, අලාභයන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමින් පවතී. |

**3.8** <u>කළමනාකරණ දූර්වලතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2018 වර්ෂයේ ලැබුණු මැනුම් නියෝග 14,845 ත් සමග 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා දෙපාර්තමේන්තුව නිම කල යුතුව තිබුණු මුළු මැනුම් නියෝග සංඛ්‍යාව 33,443 ක් වුවත්, ඉන් මැනුම් නියෝග 22,039 ක් හෙවත් සියයට 66 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | උසාවි මැනුම් නියෝග ඇතුළු හිඟහිට ඇති මැනුම් නියෝග ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ)දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකුගේ මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක් ලෙස වර්ෂ 36 කටත් පෙර පිහිටුවාගත් සම්මතය මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. | මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව සමාලෝචනය කළ යුතු වීම. | එම |
| (ඇ)සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9,622 කට තක්සේරු කර තිබුණු වාහන 327 ක් හා යන්ත්‍ර උපකරණ තොගය රජයේ තක්සේරුකරුවන් යොදා ගෙන තක්සේරු කල යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් අදාල තක්සේරු කිරීම් කර තිබුණි. | වත්කම් තක්සේරු කිරීමේදී රජයේ වෘත්තිය තක්සේරුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | එම |
| (ඈ)අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමකින් තොරව, 2013 වර්ෂයේදී මුද්‍රණය කල රු.මිලියන 4.64 ක් වටිනා ශ්‍රී ලංකා සිතියම් සංග්‍රහයේ පිටපත් 1963 ක් සහ 2015 වර්ෂයේ මිලදීගත් රු.මිලියන 1.13 ක් වටිනා ඩ්‍රෝවින් හා ලිතෝ කඩදාසි සමාලෝචිත වර්ෂය අවසානයටද ගබඩාවේ ඉතිරි වී තිබුණි. | අවශ්‍යතාවයන් හඳුනාගෙන මුද්‍රණ හා මිළදී ගැනීම් කටයුතු කළ යුතු වීම. | ජාතික සිතියම් සංග්‍රහය මුද්‍රණය කිරීමේදී මුද්‍රණාලයේ පිරිවැය අවම වන ලෙස කටයුතු කල අතර, ඉල්ලුම අඩුවීම නිසා තොග ඉතිරි වී ඇත. අපේක්ෂිත සිතියම් අලෙවිය අඩුවීම නිසා මුද්‍රණය සීමා කිරීමෙන් ලිතෝ කඩදාසි |

| | | |
|---|---|---|
| | | ඉතිරිවී ඇත. |
| (ඉ)2002 අංක 17 දරන මැනුම් පනතේ 08 වන ඡේදය අනුව සර්වේයර් ජනරාල්වරයා විසින් මුළු ශ්‍රී ලංකාවම ක්‍රම ක්‍රමයෙන් ආවරණය වන පරිදි සංඛ්‍යාංක හෝ වෙනත් ආකාරයෙන් භූගෝලීය දත්ත පාදකයක් සහ කැඩැස්තර දත්ත පාදකයක් පවත්වා ගෙන යායුතු වුවත්, භූ ගෝලීය තොරතුරු පද්ධතියට ඇතුලත් කර තිබූ වර්ග කිලෝමීටර් 20,760 ක් සඳහා වන දත්ත 1982 - 2007 අතර කාලපරිච්ඡේදයට අයත් පැරණි දත්ත බැවින් එමගින් ජනතාවට යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ අවස්ථාව මඟහැරී තිබුණි. | යාවත්කාලීන දත්ත සහ තොරතුරු ජනතාවට ලබා දීමට කටයුතු කළ යුතු වීම. | ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි භූගෝලීය `තොරතුරු පද්ධති සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. ඒ අනුව 1:50,000 සහ 1:10,000 යන පරිමානයේ භූගෝලීය තොරතුරු පද්ධති දෙකක් පවත්වාගෙන යනු ලබයි. 1:50,000 පරිමාණයේ භූ තොරතුරු පද්ධතිය 2018 වසර අවසන් වන විට මුළුමනින්ම සකසා නව සංස්කරනයක් ලෙස ස්ථාපනය කර ඇත. 1:10,000 පරිමාණයේ දත්ත පද්ධතිය 2019 - 2023 කාලය තුල යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇත. |

## 4. <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)<u>**කාර්ය මණ්ඩල පුහුණු කිරීම**</u> | | |
| දෙපාර්තමේන්තුවේ නිළධාරින්, සේවකයන් 4,073 ක් සඳහා ප්‍රවර්තන වර්ෂය තුල පුහුණුවක් ලබා දී නොතිබුණි. | කාර්යසාධනය වර්ධනය කර ගැනීමට නිළධාරීන්ට පුහුණුව ලබාදිය යුතු වීම. | 2018 වර්ෂය සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් සේවකයින් සහ නිළධාරින් 2,050 ක් සඳහා පුහුණුව ලබා දී ඇති අතර, ඉතිරි නිළධාරින් හා සේවකයින් සඳහා 2019 වසරට ලබා දී ඇති ප්‍රතිපාදන අනුව පුහුණුව ලබා දීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| **(ආ) නියමිත රාජකාරියෙන් බැහැරව සේවයේ යෙදවීම** | | |
| කාර්මික හා පරිපාලන නිළධාරින් විසින් සිතියම් තාක්ෂණ නිළධාරින් අධීක්ෂණය | ක්ෂේත්‍රයට අදාල නිළධාරීන් විසින් අධීක්ෂණය කළ යුතු | පිළිතුරු ලබා දී නොමැත. |

කල යුතු වුවද, මිනින්දෝරු වීම. සේවයේ නිළධාරින් විසින් සිතියම් තාක්ෂණ නිළධාරින් 61 දෙනෙකු අධීක්ෂණය කර තිබුණි.